**කින්නියා ප්‍රාදේශීය සභාව - 2021**

---------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 අභිතකර මතය**

------------------

කින්නියා ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ, සාකච්ඡා කළ කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කින්නියා ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 අභිතකර මතය සඳහා පදනම**

-----------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අභිතකර මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අභිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

--------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත්වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

---

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

---

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමුච්චිත අරමුදලේ ශේෂය රු.1,568,165ක් වුවත්, සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය රු.8,397,438ක් ලෙස ගිණුමේ ඉදිරියට ගෙනඒම නිසා, රු.6,829,273කින් සමුච්චිත අරමුදල වැඩිවී තිබුණි. | 2022 වර්ෂයේ අවසාන ගිණුම් වාර්තාවල නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වටිනාකම්හි නිවැරදිභාවය සනාථ කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ආදායම් අතිරික්තය රු.4,583,208ක් සමුච්චිත අරමුදල් ගිණුමට බැර කිරීම වෙනුවට හර කිරීම හේතුවෙන් සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.9,166,416කින් අඩුවෙන් දක්වා තිබුණි. | දෝෂයකින් සිදුවූ ගිණුම්කරණ අඩුපාඩුවකි. මෙයද ඉතා කඩිනමින් නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කර ඉදිරිපත් කිරීමට පියවර ගතයුතු ය. |
| (ඇ) | පළාත් නිශ්චිත සංවර්ධන අරමුදල් ප්‍රදාන (PSDG) ව්‍යාපෘති සහ පළාත්පාලන සංවර්ධනය දිරිගැන්වීමේ ව්‍යාපෘති (LDSP) සඳහා වූ වියදම් රු.5,901,949ක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් රු.5,901,949කින් අඩුවෙන් සහ ආදායම් අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් අනාවරණය කර තිබුණි. | ආදායම් ගිණුමේ ඇතුළත් කරනු ලබන බව දන්වා සිටිමි. | ආදායම් හා වියදම් ගිණුමේ වියදම් ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශන නිසි අයුරින් පිළියෙල කර ඉදිරිපත් කිරීමට පියවර ගතයුතු ය. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

---

| විගණන නිරීක්ෂණය | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ශේෂ පත්‍රය ප්‍රකාරව ණයහිමි ශේෂය රු.2,818,291ක් වුවත්, ණයහිමි ලේඛනය අනුව ශේෂය රු.2,925,091ක් වූයෙන් රු. 106,800 ක වෙනසක් විය. | මෙම ශේෂය කපාහැරීමට සභාව තීරණය කර තිබුණි. | වෙනස සැසඳීමමට පියවර ගතයුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති ,රීති ,රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| (i) 24 වගන්තිය | ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග හඳුනාගෙන ඒවා පවරා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | කඩිනමින් මෙම මාර්ග ගැසට් පත්‍රයේ පල කිරීමට පියවර ගෙන ඇත. | මාර්ග හඳුනාගෙන ඒවා පවරා ගැනීමට උචිත පියවර ගත යුතුය. |
| (ii) 126 වගන්තිය | ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ස්ථාපිත කළ දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකිරිමට පියවර ගෙන නොතිබුණි. | දැන්වීම් පුවරු සම්බන්ධයෙන් අප විසින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඔබ වෙත දැනුම් දෙනු ලැබේ. | ප්‍රාදේශීය සභා පනතට අනුකූලව පියවර ගත යුතුය. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ X පරිච්ඡේදයේ 193 වගන්තිය | ආදායම් සහ වියදම් පිළිබඳ තොරතුරු අයවැය සැලැස්ම සමග සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් අඩංගු ප්‍රකාශයක් පිළියෙල කර නොතිබුණි . | මූල්‍ය හා පරිපාලන රීති අනුව ඉදිරි කාලයේදී මෙම ප්‍රකාශ පිළියෙල කිරීමට පියවර ගනිමි. | ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති ප්‍රකාරව ක්‍රියා කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1646 | සභාවේ භාවිතයේ පවතින වාහන 13ක දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශවල මුල් පිටපත් මාසිකව ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම විගණනයට යවා නොතිබුණි. | සභාවේ පවතින සියළුම වාහනවල දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශවල මුල් පිටපත් මාසිකව ඊළඟ මාසයේ කඩිනමින් ඔබ වෙත යැවීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| **(ඈ)** 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛයේ 3.1 ඡේදය | ප්‍රාදේශීය සභාවේ ධාවනයේ පවතින වාහන 07කට ඉන්ධන දහන පරීක්ෂා සිදුකර නොතිබුණි. | කඩිනමින් මෙම වාහන සඳහා ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කිරීමක් සිදුකරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව සුදුසු පියවර ගත යුතුය. |
| **(ඉ)** 2021 අගෝස්තු 16 දිනැති අංක PT/03/2021 දරන පළාත් මූල්‍ය චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 880 | ප්‍රාදේශීය සභාවේ රාජකාරි ඉටුකරනු ලබන ඇප මුදල් අයකළ යුතු නිලධාරීන්ගෙන් ආරක්ෂිත ඇප තැන්පතු අයකර නොතිබුණි. | මේ පිළිබඳව නියමිත බලධාරීන්ගේ උපදෙස් ප්‍රකාරව පියවර ගනු ලැබේ. | අදාල චක්‍රලේඛය සහ **මුදල් රෙගුලාසි** ප්‍රකාරව කටයුතු කළයුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.4,583,208 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,829,272 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ නිශ්චල දේපළවලින් පසුගිය වර්ෂ 05කට අධික කාලයක සිට දේපළ බදු තක්සේරු කර අයකර නොතිබුණි. | උපකල්පිත වටිනාකමක් මත මෙම මුදල දක්වා ඇත. | දේපළ තක්සේරු කර බදු අයකිරීමේ කටයුතු ආරම්භ කළ යුතුය. |
| **(ආ) කුලී** | | |
| (i) 2007 සිට 2021 දක්වා කාලපරිච්ඡේදය සඳහා බදුකුලී හිමියන්ගෙන් අයකළ යුතු එකතුව රු.7,382,901ක බදුකුලී ආදායම් ඔවුන්ගෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවර ගෙන නොතිබුණි. | මෙය නිසිපරිදි පරිශීලනය කර කපාහැරීමට සභාවේ තීරණය කර ඇත | බදුකුලී අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ii) කඩකාමර කුලී ගිවිසුම් අනුව සමාලෝචිත වර්ෂය සඳහා කුලී ආදායම් රු.4,814,648ක් වුවත්, ඉන් රු. 1,505,585ක් පමණක් අයකර තිබුණි. | මේ පිළිබඳව අදාල ගිණුම් නිසිපරිදි පරිශීලනය කර ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ගිවිසුම් අනුව හිඟහිටි කුලී අයකිරීමට සුදුසු පියවර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 08කට අධික කාලයක සිට පැවත ඒන රු.380,484ක අත්තිකාරම් සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි. | කපාහැරීමට සභාව තීරණය කර ඇත. | මෙම වටිනාකම පොත්වලින් ඉවත්කිරීමට හෝ ප්‍රමාදයකින් තොරව අයකිරීමට පියවර ගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනැවිය හැකිවු තිබූ නමුත්, 2021 දෙසැම්බර් 31 දින දක්වා කාරණා 05ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | ගැසට් පත්‍රයේ පලකළ අතුරු ව්‍යවස්ථා 05ක් හැර අනෙකුත් කාරණා සඳහාවූ අතුරු ව්‍යවස්ථා පිළියෙල කිරීමට පියවර ගනිමින් පවතී. | සම්බන්ධිත කාරණා පිළිබඳව අතුරු ව්‍යවස්ථා සකස්කර අධීක්ෂණ කාර්යයන් සිදුකළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අභාවිත හෝ ඌන උපයෝජිත වත්කම් | | |
| සභාව සතු වර්ග 05කට අයත් වත්කම් 07ක් උචිත අවශ්‍යතා සඳහා මාස 03 සිට වර්ෂ 05ක් දක්වා කාලයක් භාවිතා කර නොතිබුණි. | මේ පිළිබඳව පරිශීලනය කර සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. | වත්කම් භාවිතා කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) හිමිකාරිත්වය මාරුනොකළ වත්කම් | | |
| 2018 ඔක්තෝබර් 10 දිනැති අංක MF/CO/02(cir) භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයාගේ චක්‍රලේඛය ප්‍රකාරව තමන්ට අයත් නොවන වර්තමානයේ භාවිතා කරනු ලබන වාහන 09ක් පිළිබඳව භාවිතා කිරිමේ හිමිකාරිත්වය ලබාගැනීමට ක්‍රියාමාර්ග සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභාව විසින් ගෙන නොතිබුණි. | සියළුම වාහන සභාවේ නමට හිමිකාරිත්වය මාරුකිරිමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | වාහන භාවිතා කිරීමේ හිමිකාරිත්වය ලබාගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය | | |
| භෞතික පරීක්ෂාවේදි සභාවේ ගබඩා පරිභෝජන භාණ්ඩ තොගයේ පැවැති වර්ග 13කට අයත් භාණ්ඩ 97ක ඌනතාවක් සහ වර්ග 07කට අයත් භාණ්ඩ 143ක අතිරික්තයක් පැවැතුණි. | මේ පිළිබඳව විධිමත් පරීක්ෂාවක් සිදුකර එයට අනුකූලව සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ගබඩා පාලනය සඳහා සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දියයුතුය. |

## 3.4 ව්‍යාපෘති, කර්තව්‍යයන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ රු.27,272,144ක් වැය කර 2011 සිට 2017 දක්වා කාලපරිච්ඡේදයේ ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේ මධ්‍යස්ථානය ඉදිකර තිබුණත් එහි මෙහෙයුම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ආරම්භ කර නොතිබුණු බැවින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකර ගත නොහැකිවී තිබුණි. | කඩිනමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අප විසින් ක්‍රියාමාර්ග ගෙන ඇත. | සභාවේ අරමුණු ළඟාකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 රජයේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ සැපයුම් හා සේවාවන් සඳහා සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරි කාලයේ අඛණ්ඩව මෙම ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබේ. | ප්‍රසම්පාදන සැලැස්ම නියමිත පරිදි සකස්කළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ ලේකම් තනතුර සහ පුස්තකාලයාධිපති තනතුර පුරප්පාඩුව පැවතුණි. | මේ පිළිබඳව සම්බන්ධිත බලධාරීන්ට දැනුම් දී ඇත. | අනුමත සේවක සංඛ්‍යාවේ අවශ්‍යතාව අනුව නිලධාරීන් පත්කළ යුතුය. |

## 3.7 වාහන පද්ධතිය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් රු.18,799,710ක් වූ මෝටර්රථ 19කින් වාහන 06ක් වෙන්දේසියේ විකිණීමටත්, වාහන දෙකක් අළුත්වැඩියා කිරීමටත්, භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශ කර තිබුණත්, වර්ෂ 03කට අධික කාලයක සිට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වෙන්දේසියේ විකිණීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. | වත්කම් පාලනය පිළිබඳව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ **16(2)**උප වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමග වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | නියමිත කාලපරිච්ඡේදයට ප්‍රථම ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | විගණන පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර වර්ෂය තුළ රු.496,275 ක් වූ වැටුප් ලෙස ගෙවා තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ විගණන කාර්යයන් කිසිවක් ඉටුකර නොතිබුණි. | සභාවේ මූල්‍ය පාලනය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනය සිදුකරන ලෙසට උපදෙස් ලබාදී ඇත. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට පියවර ගත යුතුය. |

### 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන අරමුණු පනත ප්‍රකාරව 2030 වර්ෂයේ ළඟාකර ගතයුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සභාව විසින් පිළියෙල කර නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම පිළිබඳව සභාව විසින් තීරණයක් ගෙන ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සියළුම සේවක කණ්ඩායම් දැනුවත් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය. |